# ප්‍රශස්ත සමාජ මාධ්‍ය භාවිතයක් සඳහා වන මාර්ගෝපදේශ මාලාව

## (සමාජ මාධ්‍යයේ නිවැරදිව හැසිරෙමු)

මාධ්‍ය නීති සංසදය

# ප්‍රශස්ත සමාජ මාධ්‍ය භාවිතයක් සඳහා වන මාර්ගෝපදේශ මාලාව

**(සමාජ මාධ්‍යයේ නිවැරදිව හැසිරෙමු )**

මුද්‍රණය:

ප්‍රකාශනය :
මාධ්‍ය නීති සංසදය
170,පළමු මහල,
අලුත්කඩේ වීදිය,
කොළඹ 12

දුරකථන : 074 3070888
info@medialawforum'org

2024 අප්‍රේල්

# ප්‍රවේශය

වර්තමානයේ සමාජ මාධ්‍ය ජනතාවගේ ප්‍රමුඛතම සන්නිවේදන මාධ්‍ය බවට පත් ව තිබේ. 2024 වසරේ ජනවාරි මාසය වන විට ලෝකය පුරා සමාජ මාධ්‍ය භාවිත කරන්නන්ගේ සංඛ්‍යාව බිලියන 5කට වැඩි වූ අතර ශ්‍රී ලංකාවේ මෙම සංඛ්‍යාව මිලියන 7.5ක් විය. 2029 වන විට ලංකාවේ සමාජ මාධ්‍ය භාවිත කරන්නන්ගේ සංඛ්‍යාව මිලියන 21.66 ක් දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර තිබේ.

සමාජ මාධ්‍ය මඟින් ජනතාවගේ ප්‍රකාශනයේ අයිතිය පුළුල් වීම නිසා, ඔවුන්ගේ සියලු අයිතීන් දිනාගැනීමට, ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට සමාජ මාධ්‍ය හේතුවක් වී ඇති බව පැහැදිලි ය. ඒ අනුව, ජනතාවගේ අයිතීන් පිළිබඳ ඔවුන්ට දැනුම් දීමට, ජනතා හඬට වේදිකාවක් ලෙස, මානව හිමිකම් සහ දේශපාලන අයිතීන් උල්ලංඝනය කරන අය හෙළිදරව් කිරීමට, මානව හිමිකම් දිනා ගැනීමේ ව්‍යාපාර දියත් කිරීමට, මෙන් ම මානව හිමිකම් ආරක්ෂකයකු වශයෙන් ද සමාජ මාධ්‍ය තීරණාත්මක භූමිකාවක් ඉටු කරමින් සිටියි.

සමාජ මාධ්‍ය ඔස්සේ මෙලෙස ජනතාවගේ ප්‍රකාශන අයිතිය පුළුල් වී තිබීම සාධනීය වුවත් ඊට සාපේක්ෂ ව සමාජ මාධ්‍ය මඟින් සමාජයට කිසියම් ආකාරයක අහිතකර බලපෑම් ද එල්ල වෙමින් පවතී. ඒහි දී ඇතැමුන් සිය ප්‍රකාශනයේ අයිතිය අවභාවිත කරමින් සිටීම තවත් පිරිසකගේ අයිතීන් උල්ලංඝණය වීමට හේතු වී තිබේ. මේ තත්ත්වය වළක්වා ගැනීමට හෝ අවම කර ගැනීමට දියුණු මාධ්‍ය සංස්කෘතියක් සහිත සමාජයන් විසින් විවිධ පියවර ගනිමින් තිබේ. සමාජ මාධ්‍ය භාවිතය සඳහා මාර්ගෝපදේශ (Code

of Practice) හඳුන්වා දීම එවන් එක් පියවරකි.

ඒ අනුව මාධ්‍ය නීති සංසදය විසින් දැනට පවතින නීතිමය රාමුව, සමාජ සාරධර්ම, වෘත්තීය ආචාරධර්ම යන මේ සියලු සාධක සැලකිල්ලට ගනිමින් සමාජ මාධ්‍ය ක්ෂේත්‍රය තුළ හැසිරිය යුතු සහ එහි දී කළ යුතු සහ නොකළ යුතු දේ සඳහා වන මඟපෙන්වීමක් ලෙස සමාජ මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් වන මේ මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙනු ලැබේ.

මෙම මාර්ගෝපදේශ මාලාව ඩිජිටල් ලෝකය තුළ හැසිරීමේ දී අනුගමනය කළ යුතු සහ නොකළ යුතු කරුණු සමූහයක එකතුවකි. කෙසේ වෙතත්, මෙවැනි මාර්ගෝපදේශ කාලීන ව සහ සමාජයීය ව වෙනස් වේ. මෙය සකසා ඇත්තේ, වාණිජ මට්ටමින් මෙන් ම පෞද්ගලික මට්ටමින් ද සමාජ මාධ්‍ය භාවිතා කරන පාර්ශ්වයන් දෙක ම සැලකිල්ලට ගනිමිනි.

# ප්‍රශස්ත සමාජ මාධ්‍ය භාවිතයක් සඳහා වන මාර්ගෝපදේශ මාලාව

## භාවිතයට පෙර දැනුම්වත් වීම

සියල්ලට පෙර ඔබ දැනුම්වත් විය යුත්තේ ඔබගේ ප්‍රකාශන අයිතිය නැත හොත් ප්‍රකාශනයේ නිදහස අසීමිත අයිතියක් හෝ නිදහසක් හෝ නොවන බව ය. ප්‍රකාශනයේ අයිතිය මූලික මානව හිමිකමක් වුවත් ඒ මත පැනවෙන නෛතික මෙන් ම ආචාර ධර්මීය සීමා ද තිබේ. ඔබ එකී සීමාවන්ට අදාළ නීති රීති, ආචාරධර්ම පිළිබඳ දැනුම්වත් ව සිටිය යුතු ය. ඒ දැනුම යාවත්කාලීන කර ගත යුතු ය.

සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකුට නොව සාමාන්‍ය පුරවැසියකුට පවා රටේ නීතිය සම්බන්ධයෙන් මූලික අවබෝධයක් තිබීම වැදගත් ය. සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු ලෙස අවම වශයෙන් ඔබට අදාළ වන නීති රෙගුලාසි සම්බන්ධයෙන් අවබෝධය හෝ ඔබට තිබිය යුතු ම ය. ඒ දැනුම්වත්භාවය ඔබ නෛතික සීමාව නොඉක්මවන බව තහවුරු කර ගැනීමට පමණක් නොව කිසියම් නීතියක සාධාරණ අසාධාරණ බව අවබෝධ කර ගැනීමටත් ඒ අනුව ක්‍රියාත්මක වීමටත් ඔබට උත්තේජනයක් සපයනු ඇත.

ඔබ සමාජ මාධ්‍ය තුළ හැසිරෙන්නේ පරිශීලකයකු ලෙස වේවා, ක්‍රියාකාරියකු ලෙස වේවා, ඔබේ හැසිරීම අනුව, අපහාස නඩු, බුද්ධිමය දේපල නඩු, ලිංගික සහ මානසික හිරිහැර කිරීම් පිළිබඳ චෝදනා, මානව හිමිකම් උල්ලංඝන චෝදනා මෙන් ම අසභ්‍ය හෝ ද්වේශ සහගත කාරණා සම්බන්ධයෙන් චෝදනා පවා එල්ල වීමට ඉඩ තිබෙන බව සිහියේ තබා ගත යුතු ය.

එවැනි අවස්ථාවකට මුහුණදීමට සිදු වුව හොත් නීතිය නොදැන සිටීම සමාවට කාරණයක් නොවන බව හැම විටෙක ම සිහියේ තබා ගන්න.

ඔබට අදාළ වන නීති රෙගුලාසි මෙන්ම මාධ්‍යකරණය සම්බන්ධයෙන්, සමාජ මාධ්‍ය භාවිතයට අදාළව පවතින එතෙර මෙතෙර ආචාර ධර්ම මාලාවන් සහ, මාර්ගෝපදේශ සම්බන්ධයෙන් ද, ඔබට අවබෝධයක් තිබීම ඔබේ භාවිතය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට හේතුවක් වනු ඇත.

සෑම සමාජ මාධ්‍ය ජාලයක් විසින් ම පාහේ සමාජ මාධ්‍ය භාවිත කරන්නන්ගේ ආරක්ෂාව සහ ඉහළ ප්‍රමිතියක් පවත්වා ගැනීම සඳහා මාර්ගෝපදේශ හඳුන්වා දී තිබේ. ඒවා සම්බන්ධයෙන් ද ඔබ දැනුම්වත් ව සිටිය යුතු ය.

## නීතිගරුක වන්න, ආචාරධාර්මික වන්න

ඔබ නීතිය ගැන හෝ ආචාරධර්ම ගැන හෝ දැන ගත යුත්තේ හුදෙක් දැනුම්වත් වීම සඳහා පමණක් නොව ඊට අනුව ජීවත් වීම සඳහා ය. එහෙත් නීතිගරුක විය යුත්තේ නීතිය තිබෙන නිසා ම නොව ඉන් ආරක්ෂා කෙරෙන මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් සහ කැමැත්තෙනි. කිසියම් නීතියක් අසාධාරණ හෝ යෝග්‍ය හෝ නොවන බව හැඟී යන්නේ නම් ඒ බව ප්‍රකාශ කිරීමටත්, ඊට එරෙහි වීමට පමණක් නොව එය වෙනස් කරවා ගැනීම සඳහා බලපෑම් කිරීමටත් නිදහස ඔබට තිබේ. සමාජ මාධ්‍ය භාවිත කරන්නකු වශයෙන් පමණක් නොව සාමාන්‍ය පුරවැසියකු ලෙස ද එය ඔබේ වගකීමක් සහ යුතුකමකි.

ආචාර ධර්ම පිළිපැදිය යුත්තේ ද එවැනි ම පදනමකිනි. නීති පිළිපැදීමට නීතිමය බැඳීමක් ඇතත් ආචාරධර්ම සම්බන්ධයෙන් එවැනි බැඳීමක් නැත. ආචාරධර්ම පිළිපදින්නේ ද නැද්ද යන්න තීරණය කළ යුත්තේ ඔබ ය. එනිසා එහි සංකල්පීය පදනම් සහ සමාජයීය වටිනාකම අවබෝධ කර ගෙන සිටීම වැදගත් ය. ආචාරධාර්මික වීම යනු ජීවන විලාසයකි.

## ඔබ ඔබ ම වන්න

සමාජ මාධ්‍ය තුළ ඇතැමකු තම සැබෑ අනන්‍යතාව සඟවමින් ව්‍යාජ නාමයන්ගෙන් පෙනී සිටීම බරපතළ ප්‍රශ්නයක් බවට පත්ව තිබේ. ඔබ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු නම් වෙනත් අනන්‍යතාවකින් හෝ අනන්‍යතාව නොහැඟෙන පරිදි පෙනී සිටීමට ඔබට අවස්ථාව තිබේ. ඒ ඔබ ප්‍රකාශයට පත් කරනු ලබන තොරතුරුවල සංවේදීතාව මත ඔබේ ආරක්ෂාව වෙනුවෙනි. එහෙත් ඔබ සැබෑ අනන්‍යතාව සඟවා ගෙන සිටින්නේ පදනමකින් තොර, තහවුරු නොකළ, අසත්‍ය හෝ ගොතන ලද හෝ තොරතුරු ප්‍රකාශයට පත් කිරීමට නම්, ඔබේ සැඟ ව සිටීමේ අරමුණ කිසිවකුට පදනම් විරහිත ව පහර දීම හෝ කිසිවකුගේ අයිතියක් පැහැර ගැනීම නම් ඔබ සමාජ

මාධ්‍ය ප්‍රජාවට නොගැළපෙන පුද්ගලයෙකි.

ඔබ සමාජ ප්‍රගමනයට හේතු වන සත්‍ය හෙළි කරන්නකු නම් ඔබේ ආරක්ෂාව වෙනුවෙන් සැබෑ අනන්‍යතාව හෙළි නොකර පෙනී සිටීමේ අයිතිය ඔබට ඇතත් කිසි ම හේතුවක් නිසා වෙනත් අයකුගේ නමින් පෙනී සිටීමේ අයිතියක් ඔබට නැත. නළු නිළියන්, ක්‍රීඩකයන් වැනි සමාජයට බලපෑමක් කළ හැකි ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ නමින් වෙනත් අය සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යෑම සමාජ මාධ්‍ය ලෝකය තුළ බහුල අවභාවිතයකි. එවැනි ව්‍යාජ සමාජ මාධ්‍ය ගිණුම් පවත්වා ගෙන යෑම ඒ නම හිමි සැබෑ පුද්ගලයාගේ කීර්තිනාමය විනාශ කිරීමක් මෙන් ම පෞද්ගලිකත්වයට හානි කිරීමක් වන සමාජය නොමඟ යැවීමකි.

## සමාජ මාධ්‍ය ජීවිතය සහ සමාජ ජීවිතය යනු එකක් නොව දෙකකි

ඔබේ සමාජ ජීවිතය සහ සමාජ මාධ්‍ය ජීවිතය යනු එකක් නොව දෙකක් බව සිහියේ තබා ගන්න. පෞද්ගලික දේ පෞද්ගලිකව තබා ගන්න. සමාජ මාධ්‍ය ඔබේ දිනපොත ලෙස භාවිත නොකරන්න. කෙසේ වෙතත් ඔබ සමාජ මාධ්‍ය තුළ පළ කරන, බෙදා ගන්නා, කැමැත්ත පළ කරන දේ අනුව, හැසිරීම අනුව ඔබේ ආකල්ප, රුචි අරුචිකම්, වෘත්තීයමයභාවය, ඔබේ ප්‍රමිතීන් සම්බන්ධයෙන් යන මේ සියල්ලෙන් ඔබ කුමනාකාරයේ මිනිසකු ද යන්න සමාජ මාධ්‍ය ප්‍රජාව තේරුම් ගන්නා බව මතක තබා ගන්න.

## දන්නා දේ හරියට දැන ගන්න නොදන්නා දේ සොයා යන්න

වාණිජ මට්ටමින් හෝ පෞද්ගලික මට්ටමින් හෝ නිවැරැදි සහ සත්‍ය බවට තමන් තහවුරු කර නොගත් කිසිවක් සමාජ මාධ්‍යයේ පළ කිරීමෙන් හෝ බෙදා හැරීමෙන් (share) වළකින්න. ඔබට සැකයක් ඇති කිසියම් තොරතුරක සත්‍ය අසත්‍යතාව විමසමින් යළි පළ කිරීම හෝ බෙදා ගැනීම ද නොකළ යුතු ය. එයින් ද සිදු වන්නේ වැරැදි හෝ අසත්‍ය හෝ තොරතුරකට ප්‍රචාරය දීමකි. ඔබ අතින් දිගින් දිගට මේ වරද සිදු වුව හොත් ඔබ සත්‍ය සහ නිවැරැදි තොරතුරු ඉදිරිපත් කළත් ග්‍රාහකයන් ඒ පිළිබඳ ව එක එල්ලේ ම විශ්වාස කිරීමට මැලි වනු ඇත. මාධ්‍යකරුවකු සතු විය යුතු මූලික ගුණාංගයක් වන්නේ විශ්වසනීයත්වයයි. එය සමාජ මාධ්‍යකරුවන්

විෂයෙහි ද එලෙසින් ම අදාළ වේ. සත්‍ය යනු අන් අය ගරු කරන සදාචාරාත්මක වටිනාකමකි.

ඔබ සත්‍යවාදී වන විට, අවංක වන විට ප්‍රජාව ද ඔබට සත්‍යවාදී වනු ඇත, අවංක වනු ඇත. අවසානයේ සමස්ත සමාජයට ඉන් යහපත් බලපෑමක් ඇති කරනු ඇත.

## ප්‍රවෘත්ති පූජනීය වන අතර අදහස් විවෘත වේ

ඔබ වාණිජ මට්ටමින් සමාජ මාධ්‍ය භාවිත කරන්නකු නම් ප්‍රවෘත්ති සහ ඔබේ මතයන් එකිනෙක සමග මිශ්‍ර නොකළ යුතු ය. එසේ ම ප්‍රවෘත්තියක් පළ කරන විටෙක ඔබේ තොරතුරු මූලාශ්‍රය සඳහන් කරන්න. එය ඔබේ ප්‍රවෘත්ති පිළිබඳ විශ්වසනීයත්වය වර්ධනය වීමට හේතුවකි. එසේ ම තමන් හෙළිදරව් නොකරන ලෙස මූලාශ්‍රය ඔබෙන් ඉල්ලා ඇත්නම්, කිසිම විටෙක එය හෙළි නොකිරීමට වගබලා ගත යුතු ය. එය ඔබ වගකීම් සහගත සමාජ මාධ්‍යකරුවකු බව පෙන්වන ලක්ෂණයකි.

## ඔබට ලැබෙන හැම තොරතුරක් ම වාර්තා කිරීමට හෝ බෙදා ගැනීමට හෝ නුසුදුසු විය හැකි ය.

තොරතුරක් සත්‍ය සහ නිවැරැදි වූ පමණින් එය පළ කිරීමට හෝ බෙදා ගැනීමට හෝ සුදුසු නොවිය හැකි ය. තොරතුරක්, අදහසක් පළ කිරීමට හෝ බෙදා ගැනීමට හෝ පෙර දෙවරක් ඒ ගැන කල්පනා කරන්න. කිසියම් අදහසක්, තොරතුරක් පළ කිරීමට බෙදා ගැනීමට පෙර ඉන් සමාජයට ඇති විය හැක්කේ කුමන ආකාරයේ බලපෑමක් දැයි සිතා බලන්න. ඔබ පළ කළ යුත්තේ ද, බෙදා ගත යුත්තේ ද සමාජයට යහපත් බලපෑම් ඇති කරන අදහස් හෝ තොරතුරු හෝ පමණකි. සාම්ප්‍රදායික මාධ්‍යයේ මෙන් සමාජ මාධ්‍යයේ දී ප්‍රවෘත්ති අනුමත කිරීමට, සංස්කරණය කිරීමට කිසිවකු නැත. වාර්තා කරන්නේ ද, අනුමත කරන්නේද සංස්කරණය කරන්නේ ද ඔබ ම විය හැකි ය.

## වැරැදි සිදු විය හැකි ය. එහෙත් ලොකු ම වැරැද්ද වන්නේ ඒවා නිවැරැදි නොකිරීම ය.

කොතරම් ප්‍රවීණයකු අතින් වුවත් වැරැදි සිදු විය හැකි ය. ඔබ

අතින් වැරැදි, අසත්‍ය, අනුචිත යමක් සමාජ මාධ්‍යයේ පළ වූ හෝ ඔබ විසින් බෙදා හැර හෝ තිබෙන බව තහවුරු වුව හොත් ඒ වහා ම ඔබේ වරද පිළිගන්න. වරද නිවැරැදි කිරීම සඳහා ගත හැකි උපරිම පියවර ගන්න. ඔබේ ක්‍රියාව නිසා අගතියට පත් පාර්ශ්වයක් වේ නම්, හානිපූර්ණය සඳහා අවශ්‍ය පියවර ගන්න. අවම වශයෙන් ඔබ ඔබේ සමාජ මාධ්‍ය වේදිකාව තුළ අගතියට පත් පාර්ශ්වයේ හඬට ඉඩක් ලබා දිය යුතු ය. කෙසේ වෙතත් වැරැදි පිළිගැනීම සහ ඒවා නිවැරැදි කිරීම ඉහළ ප්‍රමිතියකින් යුත් භාවිතයක ලක්ෂණයක් වුවත් එය නිතර සිදු නොවන්නට වග බලා ගත යුතු ය. නිතර වැරැදි සිදුවීම ඔබේ භාවිතයේ වෘත්තීමයභාවය පිළිබඳ ප්‍රශ්නයක් බැවිනි.

හැම විටෙක ම නිවැරැදි දේ තෝරා ගන්න, අනුගමනය කරන්න. කිසි ම විටෙක වෙනත් අය කරන නිසා තම වරද සාධාරණීකරණය නොකරන්න. බහුතරයක් එක මතයක සිටියත් වරදක් නිවැරැදි වන්නේ නැත. එනිසා බහුතරය වෙනත් මතයක් දැරුවත් නිවැරැදි දේ කිරීමට සහ ඒ වෙනුවෙන් පෙනී සිටීමට පියවර ගන්න.

## ප්‍රකාශනයේ නිදහසට මුවා වී බුද්ධිමය දේපළ සොරකු නොවන්න

අන්‍යයන්ගේ අදහස්, නිර්මාණ, දැනුම ඔවුන්ගේ අනුමැතියකින් තොරව පළ කිරීම සහ තමන්ගේ ඒවා ලෙස පළ කිරීම සහ බෙදා හැරීම සමාජ මාධ්‍ය තුළ බහුල ව සිදු වේ. අන් අයකුගේ බුද්ධිමය දේපලක් එලෙස භාවිතා කිරීම සැලකෙන්නේ බුද්ධිමය දේපල සොරකමක් ලෙස ය. එය ඇතැම් විට දඬුවම් ලැබිය හැකි වරදකි. එසේ ම එය සදාචාරමය වරදකි. එසේ ම ඔබගේ නොහැකියාව සහ නොදන්නාකම ප්‍රදර්ශනය කිරීමකි. කුමන හෝ අවස්ථාවක අන් කෙනකුගේ බුද්ධිමය දේපලක් වන යමක් භාවිත කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා අදාළ පුද්ගලයාගේ අවසරය ලබා ගන්න. එවැනි අවසරයක් අවශ්‍ය නොවන අවස්ථාවක වුවත් තම ඉදිරිපත් කිරීම තුළ අදාළ පුද්ගලයාගේ නම සඳහන් කිරීමට වග බලාගන්න.

ඔබේ පවුලේ කෙනකු හෝ ළඟ ම මිතුරකු සමඟ ඔබ පෙනී සිටින ඡායාරූපයක් වුව ද සමාජ මාධ්‍ය තුළ පළ කිරීමට පෙර එකී පුද්ගලයා දැනුම්වත් කර ඔහුගේ අනුමැතිය ලබා ගන්නට කටයුතු කිරීම දියුණු සමාජ මාධ්‍ය භාවිතයකි.

## අදහස් පළ කිරීමේ වරප්‍රසාදය සමාජ විරෝධී යුද පිටියක් නොකර ගන්න

සමාජ ඒකාග්‍රතාව බිඳ හෙළීමට හේතු විය හැකි ජාතිවාදී, ආගම්වාදී වැනි අන්තවාදී ක්‍රියාකාරකම් අනුමත කෙරෙන හෝ ප්‍රවර්ධනය කෙරෙන තොරතුරු හෝ සමාජ නොසන්සුන්තාවකට හේතු විය හැකි අදහස් පළ කිරීමෙන් හෝ බෙදා ගැනීමෙන් හෝ වැලකිය යුතු ය. දාමරික ක්‍රියා, ප්‍රචණ්ඩ ක්‍රියා, ඝාතන, මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරැදි, කෲරත්වය, ව්‍යභිචාරයන් ,ළමා සහ කාන්තා අපචාර වැනි සමාජයේ යහ පැවැත්මට බාධා කරන, සමාජය තුළ කම්පනයක් ඇති කෙරෙන ක්‍රියා සම්බන්ධ සිදුවීම් වාර්තා කිරීමේ හෝ බෙදා ගැනීමේ හෝ අවශ්‍යතාවක් තිබේ දැයි පළමු ව තීරණය කරන්න. වාර්තා කිරීමට හෝ බෙදා ගැනීමට හෝ තීරණය කරන්නේ නම්, එවැනි ක්‍රියා සාධාරණීකරණය හෝ ප්‍රවර්ධනය නොකෙරෙන ලෙස නිසි සංවේදීතාවකින් සහ සැලකිල්ලකින් යුතු ව කටයුතු කරන්න.

සමාජ මාධ්‍ය වෛරය පැතිරවීමේ වේදිකාවක් නොකර ගන්න. වෛරීය ප්‍රකාශ පිටු දකින්න. ඕනෑ ම කාරණයක් සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය තුළ වාද විවාද පවත්වා ගෙන යා හැකි නමුත් ඒ හැම විටෙක ම විෂය මූලික වන්න. තාර්කික වන්න .

## වෙනස්කර ගත නොහැකි වෙනස්කම්වලට අපහාස නොකරන්න

කිසිම පුද්ගලයකුගේ ජාතිය, වර්ගය, ලිංගික දිශානතිය සහ ශාරීරික සහ මානසික ආබාධ පිළිබඳ අගති, අවමන් සහගත ලෙස කරුණු සඳහන් නොකළ යුතු ය. පුද්ගලයකුගේ ජාතිය, වර්ගය, ලිංගික දිශානතිය සහ ශාරීරික සහ මානසික ආබාධ පිළිබඳ වාර්තා කළ යුත්තේ ද කතාවට ඍජු ව ම අදාළ වන්නේ නම් පමණකි.

## නිහතමානී වන්න

සමාජ මාධ්‍ය යනු පොදු අවකාශයකි. ඒ තුළ හැසිරීමට ඔබට ඇති අයිතිය ඒ හා සමාන ව ම හැම කෙනකුට ම තිබේ. සමාජ මාධ්‍ය තුළ ආචාරශීලී වන්න, නිහතමානී වන්න. අන් අයට ගරු කරන්න. අන් අයට තම අදහස් පළ කිරීමට අවස්ථාව දෙන්න.

ඕනෑ ම කෙනකුගේ අදහසකට විරුද්ධ වීමට ඔබට අයිතිය ඇතත් ඊට පෙර එම අදහසට සවන් දෙන්න. ඔබ සියල්ල දත් කෙනකු බව ඔප්පු කිරීමට උත්සාහ නොකරන්න. වහසි බස් දෙඩීමෙන් වළකින්න. කිසිවකුගේ අදහසක් සමඟ එකඟ වීමට නොහැකි නම්, ආචාරශීලී ව සුදුසු පරිදි ඒ බව පවසන්න. හැම විට ම විනිවිද භාවයෙන් යුතු ව කටයුතු කරන්න.

## ප්‍රජාව මුළා නොකරන්න

අසත්‍ය හෝ නිවැරදි නොවන හෝ තොරතුරු පළ කිරීම සහ බෙදා හැරීම මෙන් ම, කිසියම් තොරතුරක් අතිශයෝක්තියට නැංවීම ද නොකළ යුත්තකි. එයින් ද සිදු වන්නේ සමාජ මාධ්‍ය ප්‍රජාව මුළා කිරීමකි.

කිසිම විටෙක මිථ්‍යාවට ඔබේ සමාජ මාධ්‍ය වේදිකාව තුළ ඉඩ නොදෙන්න. මිථ්‍යාව ප්‍රවර්ධනය නොකරන්න.

ඔබ කිසියම් තොරතුරක් හෝ අදහසක් පළකරන්නේ හෝ බෙදා ගන්නේ හෝ වාණිජ අරමුණකින් නම් ඒ බව පැහැදිලි ව සඳහන් කරන්න. සමාජ මාධ්‍ය වංචනික ගනුදෙනු, රැවටීම් ආදියෙන් පිරී පවතී. කිසි ම විටෙක එවැනි ක්‍රියාවන් නොකළ යුතු අතර එවැන්නක් ප්‍රවර්ධනය කිරීමට හෝ කටයුතු නොකළ යුතු ය.

ඔබට කිසියම් කරුණක් සම්බන්ධයෙන් ලැදියාවන් අතර ගැටුමක් තිබේ නම් ඔබ කරුණු ඉදිරිපත් කළ යුත්තේ ඒ බව සඳහන් කරමිනි. එසේ නොහැකි නම් නිහඬ වන්න.

## පෞද්ගලිකත්වයට, කීර්තිනාමයට ගරුකරන්න, ආරක්ෂා කරන්න

ඕනෑ ම තරාතිරමක අයකුගේ පෞද්ගලිකත්වයට ගරු කරන්න. එසේ ම පුද්ගල කීර්තිනාමයන්ට ගරු කරන්න. හිතාමතා ම කිසිවකුගේ පෞද්ගලිකත්වයට හෝ කීර්තිනාමයට හෝ හානි කිරීමෙන් වළකින්න. අපහාස කිරීමෙන් වළකින්න. සත්‍යය ප්‍රකාශ කිරීමෙන් කිසිවකුට අපහාසයක් සිදු නොවේ. එහෙත් කිසියම් පුද්ගලයකුගේ පෞද්ගලික ජීවිතය සම්බන්ධයෙන් යම් තොරතුරක් මත දැක්වීමක් පළ කිරීම හෝ බෙදා ගැනීම හෝ කළ යුත්තේ එය සැබෑ ලෙස ම මහජන යහපත උදෙසා වන්නේ නම් පමණකි.

## සමාජ ප්‍රමිතීන් පහත නොහෙළන්න

පොදු ජන රුචිකත්වයට හෝ සදාචාරයට හානි කළ හැකි හෝ, තත්ත්වය පහත හෙළීමට හේතු වන කිසිවක් ප්‍රකාශයට පත් කිරීමෙන් වැළකී සිටිය යුතු ය. මහජන යහපත පිණිස වන්නේ නම් මිස අසභ්‍ය කරුණු වාර්තා කිරීමෙන් වැළකී සිටිය යුතු ය. පර පීඩා කාමුකත්වය, සැහැසිකම් හෝ සල්ලාලකම් ප්‍රවර්ධනය කෙරෙන ආකාරයට කටයුතු කිරීමෙන් වැළකිය යුතුය. ඔබ එවැනි තොරතුරු හෝ අදහස් හෝ පළ කරන්නේ නම් හෝ බෙදා ගන්නේ නම් හෝ ඔබේ ආකල්ප, ජීවන විලාසය සහ ජීවන දැක්ම පිළිබඳ අදහසක් ප්‍රජාව විසින් ලබා ගනු ඇත. නරක ම තත්ත්වය වන්නේ ඔබ නිසා එවැනි අදහස් ප්‍රජාව තුළ සාමාන්‍යකරණයට ලක් වීමට ඉඩ තිබීම ය.

ඇතැම් විටෙක සමාජ මාධ්‍ය ප්‍රජා මාර්ගෝපදේශයන්ට (social media community guideline) අනුව වරදක් නොවන කරුණක් අප සමාජ සන්දර්භයට අනුව අසභ්‍ය, නොගැළපෙන, අනුචිත කාරණයක් විය හැකි ය. එවැනි කාරණා සම්බන්ධයෙන් ද කල්පනාකාරී විය යුතු ය.

## මරණය අලෙවි භාණ්ඩයක් නොකර ගන්න

හොඳම තත්ත්වය වන්නේ සිය දිවි හානි කර ගැනීම් පිළිබඳ සිදුවීම් වාර්තා කිරීම හෝ බෙදා ගැනීම හෝ නොකර සිටීම ය. යම් හෙයකින් එවැන්නක් වාර්තා කරන්නේනම් හෝ බෙදා ගන්නේ නම් හෝ එය කළ යුත්තේ සිය දිවි හානිකර ගැනීම් ප්‍රවර්ධනය නො කෙරෙන ලෙස ය. සිය දිවි හානි කර ගත් ආකාරය ගැන සවිස්තර ව සඳහන් නොකරන්න. කිසිවකු සිය දිවි හානි කර ගත් ආකාරයයෙන් ම බොඳ කර හෝ මළ සිරුරේ ඡායාරූප, වීඩියෝ දර්ශන ප්‍රචාරය නොකරන්න. එසේ ම ඝාතන, ස්වාභාවික විපත් නිසා මිය ගිය අයගේ ද මළසිරුරු පෙන්වීමෙන් වළකින්න.

## ඇතැම් පුද්ගල කණ්ඩායම් වෙනුවෙන් තිබෙන වරප්‍රසාද දැනගන්න, ඒවාට ගරු කරන්න

දරුවන්, කාන්තාවන් සහ වැඩිහිටියන් හා ආබාධ සහිත වූවන් සම්බන්ධ ව පොදු සමාජය තුළ විශේෂ සැලකීම් සහ ප්‍රමුඛතා

තිබේ. එවැනි පුද්ගල කණ්ඩායම් පිළිබඳ සමාජ මාධ්‍ය තුළ කරුණු දැක්විය යුත්තේ එකී සමාජ තත්වයන්ට නිගරු නොවන පරිදි ය. ඒවා වැඩි වර්ධනය නොකෙරෙන ලෙස ය. ළමා අපචාර, ස්ත්‍රී දූෂණ වාර්තා කරන්නේ නම්, එකී වින්දිතයා හඳුනා ගත හැකි ආකාරයට නම සහ ඡායාරූප හෝ වෙනත් කරුණු සඳහන් නොකළ යුතු අතර, වින්දිතයා කවුරුන් දැයි හඳුනා ගත හැකි වන ආකාරයට ඥාතීන්, හිතවතුන් පිළිබඳ සඳහන් කිරීම් වැනි කිසි ම තොරතුරක් සඳහන් නොකළ යුතු ය.

අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා ලබන බාල වයස්කරුවන්ගේ නම් සඳහන් නොකළ යුතු ය. හඳුනා ගත හැකි ආකාරයෙන් ඡායාරූප පළ නොකළ යුතු ය. බාලවයස් කරුවකු අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා ලබන හෝ වරදකරුවකු කෙරෙන අවස්ථාවක් මෙන් ම වැඩිහිටියකු, අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ හෝ වරදකරු කරනු ලැබූ අවස්ථාවක හෝ නම් කිරීමේ දී ඔහුගේ නෑ හිතවතුන් අතර සම්බන්ධය හෙළි කළ යුත්තේ මහජන යහපත උදෙසා වන්නේ නම් පමණකි. විවාහ, දික්කසාද නඩු වාර්තා කිරීමේ දී, වින්දිතයන්ට සිත් වේදනා ගෙන දෙන, පෞද්ගලිකත්වයට හානි කරන ආකාරයෙන් වාර්තා නොකළ යුතු ය.

පොදු සමාජය තුළ මෙන් ම සමාජ මාධ්‍ය ලෝකය තුළ ද කාන්තාව ලිංගික හිංසනයට මෙන් ම විවිධ පීඩාවන්ට, හිංසනයන්ට ගොදුරු වීමේ වැඩි ප්‍රවණතාවක් තිබේ. අප සමාජ මාධ්‍ය භාවිත කළ යුත්තේ කාන්තාව එවැනි හිංසාවනට ලක් කිරීමට මාධ්‍යයක් ලෙස නොව කාන්තාව පොදු සමාජයේ මුහුණ දී සිටින පීඩාවන් තුරන් කිරීමට, අවම කිරීමට දැනුම්වත් කිරීමේ මාධ්‍යයක් ලෙස ය.

## ඔබේ ආරක්ෂාව පිණිස සැලකිලිමත්වන්න, ක්‍රියාත්මක වන්න

සමාජ මාධ්‍ය ජනතාවගේ අදහස් පළ කිරීමේ අයිතිය පුළුල් කර සමාජ ප්‍රගමනයේ ගාමක බලවේගයක් බවට පත් ව තිබෙන නමුත් ඒ තුළ විශාල අඳුරු ලෝකයක් ද ක්‍රියාත්මක වෙමින් තිබේ. සමාජ මාධ්‍ය මිනිසා අතර තොරතුරු බෙදා ගැනීම, දැනුම්වත් වීම වේගවත් කර ඇත්තා සේ ම මිනිස් ජාවාරමේ සිට විවිධාකාරයේ ජාවාරම් පහසු කරන වේගවත් කරන මාධ්‍යයක් බවට ද පත් ව තිබේ. පොදු සමාජය තුළ මෙන් ම ඒ තුළ ද රැවටීම්, වංචා, නොමඟ

යැවීම් බහුල ය. ඔබ සමාජ මාධ්‍ය භාවිතා කරන්නකු නම්, ඒ තුළ ක්‍රියාත්මක ජාවාරම්, වංචා, රැවටීම්, නොමඟ යැවීම්වල වින්දිතයකු බවට පත් නොවී සිටීමට ඔබ සැලකිලිමත් විය යුතු ය.

ඒ සඳහා ඔබ

1. අතිශය පෞද්ගලික තොරතුරු සමාජ මාධ්‍ය ඔස්සේ කිසිවකු සමඟ බෙදා නොගන්න.

2. ඔබගේ මූල්‍ය තොරතුරු, බැංකු ගිණුම් අංක, ණයවර කාඩ් අංක, හැඳුනුම්පත් අංක විශ්වාසවන්ත නොවන මූලාශ්‍ර වෙත ලබා නොදෙන්න.

3. ඔබගේ බැංකු කාඩ්, ණයවර කාඩ් රහස්‍ය අංක කිසිම පිටස්තරයකුට ලබා නොදෙන්න.

4. අන්තර්ජාලය තුළ හෝ සමාජ මාධ්‍ය මගින් ප්‍රසිද්ධ කෙරෙන ඇදහිය නොහැකි ත්‍යාග ලබා දෙන බව කියන තරග සඳහා සහභාගි නොවන්න. ඔබ හොඳින් ම දන්නා ප්‍රසිද්ධ සමාගමක නමින් එවැනි ත්‍යාග ලබා දෙන බව පවසා තිබුණත් විශ්වාස නොකරන්න. ඔබට දැඩි අවශ්‍යතාවක් තිබේ නම් සොයා බලා, රැවටීමක්, හානියක් නොවන බව තහවුරු කර ගන්න.

5. සමාජ මාධ්‍ය ඔස්සේ ඔබ කිසියම් රැවටීමකට ලක් වූයේ නම්, ඔබට කිසියම් අගතියක් වූයේ  නම් වහා ම පොලීසිය සහ අදාළ ආයතන දැනුම්වත් කරන්න .අන්තර්ජාලය හෝ සමාජ මාධ්‍ය හෝ හරහා සිදු කෙරෙන ජාවාරම් පිළිබඳ තොරතුරු අනාවරණය කර ගත හැකි අතර එවැනි නීති විරෝධී, සමාජ විරෝධී ක්‍රියාවනට එරෙහි ව කටයුතු කිරීමට ප්‍රමාණවත් තරම් නීතිමය ප්‍රතිපාදන ද තිබේ. එහෙත් මෙවැනි ක්‍රියාවන්ගේ වින්දිතයන් වන බොහෝ දෙනකු  ලැජ්ජාව හෝ වෙනත් කාරණයක් නිසා හෝ තමන්ට සිදු වූ අගතිය සම්බන්ධයෙන් හෙළි කරන්නේ හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරිපත් වන්නේ හෝ නැත. එහෙත් ඔබ තමන්ට සිදු වූ අගතිය සම්බන්ධයෙන් කරුණු හෙළි කරන්නේ නම්, ඉන් ඔබට සාධාරණය ඉටු කර ගැනීමට මෙන් ම තවත් කෙනකුට  ඔබ මෙන් ම වින්දිතයකු නොවී සිටීමට දැනුම්වත් කිරීමක් ද වනු ඇත.